Page 2 October 2012.qxd 24/10/2012 06:29 Page 1



ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 2 3 5 2 0 1 4 6
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න ලොකුලියන
*Computer Graphics* : Channa Lokuliyana
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# බුදුදහම නිවැරදිව තේරුම් ගනිමු!

**පූජ්‍ය කුසුම්පොකුණේ පඤ්ඤානන්ද හිමියන් විසිනි**



**අ**ප තථාගත බුදුරජාණන් වහන්සේ දෙසූ දහම බොහෝ පහසුවෙන් තේරුම ගැනීමට හැකි දහමකි. එහෙත් බුදු දහමේ මූලික කරුණු බොහෝ දෙන නිවැරදිව තේරුම්ගෙන නැත.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ**
**සම්මා සම්බුද්ධස්ස**

යනුවෙන් බුදුන් වැඳීමේ නමස්කාර පාඨය ගෙන බලමු. අපි කවුරුත් හොඳට ශබ්ද නගා මෙය කියන්නෙමු. එහෙත් එහි අර්ථය සහ එහි වචනවල හට ගැන්ම දන්නේ කීයෙන් කී දෙනාද? මේ ගාථාව එම අර්ථය වඩාත් පැහැදිලි කරයි.

**සාතාගිරෝ නමෝ යක්ඛ**
**තස්ස ච අසුරින්දදෝ**
**භගවතෝ ච මහා රාජා**
**සක්කෝ අරහතෝ තථෝ**
**සම්මා සම්බුද්ධස්ස බ්‍රාහ්මනෝති**

සාතාගිරෝ නමො යක්ඛ. - සාතාගිරි යක්ෂයා විසින් බුදුන්වහන්සේ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරගත් පසු **නමෝ** කියා වැඳ ගෞරව කරන ලදී. සාතාගිර එසේ කීවේ මේ අරුතිනි. **න** අකුරින් නරකා දියට තම ආත්මය ගෙන නොයා, **මෝ** අකුරින් මෝක්ෂය හෙවත් විමුක්තිය කරා ගිය හෙයින් එසේ ගෞරව කරන ලදී.

**තස්ස ච අසුරින්දදෝ** - යනුවෙන් රාහු අසුරේන්ද්‍රයා ඒ මොහොතේ පැමිණ **'ත'** යනුවෙන් තමන් වහන්සේ, **'ස්'** යනුවෙන් ස්වයංභූ ප්‍රඥාවෙන් **'ස'** අකුරින් සම්බුද්ධ කියන තත්වය අවබෝධ කර ගන්නා ලද බවයි.

**භගවතෝච මහාරාජා** – සතරවරම් රජ දරුවන් පැමිණ භාග්‍යයක් උදාකරගන්නා ලද්දේ යයි වැන්දාහ.

**සක්කෝ අරහතෝ තථෝ** – ශක්‍ර දෙවියෝ එතැනට පැමිණ උන්වහන්සේ සකල ක්ලේශ ධර්මයන් ක්‍ෂය කොට උතුම් අර්හත්භාවය ලැබුවා කියා වැන්දෝය.

**සම්මා සම්බුද්ධස්ස බ්‍රාහ්මනෝති** – මහා බ්‍රහ්මයා පැමිණ **සම්මා** යනුවෙන් යහපත්, **සම්** යනුවෙන් තමන්ගේ, **බුද්ධස්ස** යන වෙන් **තම බුද්ධිය දැක්කා** කියා වැඳ ගෞරව කරන ලදී.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස** යන පාඨයේ අදහස හා එම වචන මුලින්ම බිහිවූයේ කෙසේදැයි අභවන විස්තරයකි මේ පැහැදිලි කළේ.

බුදුන් වදින විට එම ගාථාවන්හි නිවැරදි අර්ථය දැන වැඳීම බෞද්ධයන්ට මහඟු පිටු වහලක් වන බව දත යුතුයි. යමක් කියන් නන් වාලේ නොකියා නිවැරදි අර්ථය දැන ගෙන කීම කෙනෙකුගේ බුද්ධිය නිවැරදිව සකස්කර ගැනීමට හැකි වෙනවා ඇත.

ලෝකයේ ප්‍රඥාව ගත් කල එය හැමටම එකසේ නොපිහිටන බව තථාගතයන් වහන්සේ මෙසේ වදාරා තිබේ.

**අන්ධ භූතෝ අයන් ලෝකෝ**
**තනු කෙත්තෝ විපස්සතී**
**සකුන්තෝ ජාල මුත්තෝව**
**අප්පෝ සග්ගාය ගච්ජතී**

මේ ලෝකයේ සිළු දෙන අන්ධ භූතයෝය. එහෙත් එයින් එකෙක් හෝ විනිවිද දක්නා නුවණකින් ලෝකයේ තතු තම බුද්ධියට හසුකර ගනී. ඒ කෙසේදැයි බුදු හිමියෝ උපමාවක් ද දේශනා කර වදාළහ. කුරුළු වැද්දා දැල එලන්නේ කුරුල්ලන් දඩයම් කිරීමටය. කුරුල්ලෝ දැලට හසුවෙති. නමුත් මේ සතුන්ගෙන් එකෙක් දැලේ ඇති ගැට ලිහාගෙන ඉන් ගැළ වී යයි.

බුදුහාමුදුරුවන් දේශනා කළ ආර්‍යය අෂ්ඨාංගික මාර්ගය සංසාර ගමන අහෝසි කරන්නට පෙන්වා දී ඇති හොඳම මාර්ගයයි. ඉහතින් සඳහන් කළ විනිවිද දක්නා නුවණ මෙහෙයවා එය ප්‍රත්‍යක්‍ෂ කර ගත යුතුය.

***සද්ධාතිස්ස විදසුන් අරණ***
***මිදලන - පැල්මඩුල්ල Sri Lanka***

# මව්පියනි! දරුවන් බේරා ගන්න!

**ශ්‍රී**මත් ජිමි සැවිල් **(Sir Jimmy Savile)** මහා බ්‍රිතාන්‍යයේ මේ මෑත භාගයේ විසූ අතිශය ජනප්‍රිය ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත්කරන්නා හා සම්පාදකවරයා විය. ශ්‍රාවකයින් ප්‍රේක්‍ෂකයින් දැහැනක ඇද බැඳ තබාගන්නට සමත් අපූර්ව කුසලතාවෙන් පිරිපුන්ව සිටි ඔහු ළමා තරුණ වැඩිහිටි යන තුන් පිරිස අතරේ ඉමහත් ආදරයට හා ගෞරවයට පාත්‍රව සිටියේය. ඔහු මෙහෙයවූ **Top of the Pops** හෝ **Jim will fix it** වැනි වැඩසටහන් බ්‍රිතාන්‍ය සංනිවේදන මාධ්‍යයේ අංක **1** ට ගණන් ගැනුණු අතර ඒවා නැරඹූ රසික පිරිස් මිලියන ගණනකි.

ඔහු මෙහෙයවූ වැඩසටහන් තුළින් දියත් කළ පුණ්‍යායතන සඳහා පවුම් මිලියන **300** කට වඩා මුදල් පරිත්‍යාග ලැබී ඇති බව සඳහන් වෙයි. **Jim will fix it** වැඩ සටහන මුළුමනින්ම කැපකර තිබුණේ අසරණ අයගේ සහ රෝගී ළමයින්ගේ සිත්හි තිබූ සිහින සැබෑ කරමින් අතගසන්නට අපහසු දුෂ්කර කාර්යයන් ඔවුන්ට ඉටුකරදීමයි.

ඔහුගෙන් වූ සේවය වෙනුවෙන් 1971 දී **OBE** ගෞරව නාමයද 1990 දී ශ්‍රීමත් යන නයිට් නාමයද පිරිනැමිණ. එසේම ලීඩ්ස් විශ්ව විද්‍යාලය ඔහුට විශේෂ නිති උපාධියක් පිරිනැමුවා ය. පසු ගිය වසරේ ඔහු හදිසියේ රෝගාතුරව නිව්මෝනියාව වැළඳී මියගියේය. එවිට ඔහුගේ වයස 84 කි.

ගිය සතියේ (03.10.12) **ITV** රූපවාහිනිය මගින් **The Other side of Jimmy Savile** නමැති වාර්තා චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළේ ය. එහි මුළුමනින්ම වූයේ සැවිල් 1960 සිට දශක තුනක් තිස්සේ **BBC** රූපවාහිනී මැදිරි වල සහ වෙනත් ස්ථානවලදී ද, ඔහුගේ සුඛෝපභෝගී කැඩිලැක් මෝටර් රථය තුළ දී ද ඉතා ලාබාල බාලිකාවන් තිස් හතළිස් ගණනක් ලිංගික අතවරවලට ද දූෂණයට ද ලක්කර ඇති බවයි. බොහෝ වියපත් කාන්තාවන් දැන් ඉදිරියට පැමිණ සැවිල් ඔවුනට ළමා වියේදී කරන ලද ලිංගික අතවර විස්තරකර දක්වා තිබිණ. මෙම අනාවරණය අද බ්‍රිතාන්‍ය සමාජය සසල කරන්නට හේතුවූවාක් මෙන්ම බීබීසි ආයතනයට වූ විශාල කැළලකි.

දැන් පැහැදිලි වන පුදුමය නම් බීබීසී ආයතනයේ එදා ඉහළ තැන්වල සිටි බොහෝ දෙනා ජිමි සැවිල්ගේ ඒ ක්‍රියාකලාපය ගැන එකල දැන සිටියත් කිසිවෙකු ඊට කිසිදු පියවරක් නොගැනීමයි. එපමණක්ද නොව එහිම තවත් බොහෝ අය එම වැඩසටහන්වලට එන බාලිකාවන් කෙලෙසන බව ද කියැවේ.

මේ ඉහතින් දැක්වූ සියල්ල බ්‍රිතාන්‍යයේ පමණක් නොව මුළුලොව සියළු රටවල සිටින දෙමාපියන් තරයේ සිතට ගතයුතු දේවල් ය. එනම් තම ලාබාල දරුවන් කිසිවිටෙක තනිවම ගුවන්විදුලි රූපවාහිනී මැදිරිවල වැඩසටහන් වල තනිකර නොඑන්නට ය. එකල මෙන් තව මත් මුළු ලොවම දෙමාපියන්ට වැළඳුණු මහා පිස්සුවක් නම් තම ලාබාල දරුවන් ඒ තැන් වලට යවා ලොව වටා ජනප්‍රිය කරවීමය. ඒ මැදිරි තුළ යක්‍ෂයින් සිටින බව ඒ මෝඩ මිනිසුන් තවම වටහානොගැනීම අවාසනාවකි.

# Religions should face investigation.......



ස්වාමි විවේකානන්ද

" Experience is the only source of knowledge. The same methods of investigation which we apply to the sciences and to exterior knowledge should be applied to religion. If a religion is destroyed by such investigation, it means that religion is nothing, but a useless and unworthy collection of superstitious beliefs; the sooner it disappeared, the better. Why religions should claim that they are not bound to abide by the standpoint of reason no one knows…..it is better that mankind should become atheist by following reason than blindly believing in two hundred million gods on the authority of anybody….."

**- Swami Vivekananda**

## ආගම් තර්කානුකූල විමසුමට ලක්විය යුතුය!

" **අ**ත්දැකීම දැනුම ලැබීමට ඇති එකම මූලාශ්‍රය වෙයි. අප විද්‍යාවට හා බාහිරින් ලබා ගන්නා දැනුම ලැබීමට යොදන පරීක්‍ෂණ ක්‍රම ආගම ගැන විමසීමේදී ද භාවිතා කළ යුතුය. එසේ පරීක්‍ෂණයට භාජනය කරද්දී යම් ආගමක් විනාශයට පත් වේ නම් ඉන් හැඟෙන්නේ ඒ ආගම කිසි ප්‍රයෝජනයක් නැති, නොවටිනා, මිත්‍යා ඇදහිලි එකතු කර තැනූ පුහු ආගමක් බවයි. එවැනි ආගමක් අතුරුදහන්ව ගිය තරමට හොඳ ය. තර්කානුකූල පරීක්‍ෂාවන්ට භාජනය වන්නට තමන් බැඳී නැතැයි ආගම් ප්‍රකාශකර සිටින්නේ ඇයි දැයි කිසිවෙකු නොදනී. දැනමුත්තන්ගේ කීම දොහොත් මුදුණින් පිළිගනිමින් අන්ධයින් ලෙස තිස්තුන් කෝටියක් දෙවිවරුන් අදහනවාට වඩා, මිනිස් වර්ගයා, සාධාරණ තර්කානුකූල බුද්ධිය අනුගමනය කරමින් දේව විශ්වාසය අත්හැරීම නුවණට හුරු ය. "

## ❊ අද දවසට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**මෘද්ඝටවත් සුඛභෙද්‍යො**
**දු:සංධනශ්ච දුර්ජනො භවති**
**සුජනස්තු කනක ඝටවත්**
**දුර්භේද්‍යශ්චාතු සංධෙය:**

***අර්ථය*** : දුර්ජනයා මැටි කළයක් මෙන් පහසුවෙන් බිඳිය හැක. යළි ගලපා ගනු නොහැක්කේ ද වේ. සත්පුරුෂයා රන් කළයක් මෙන් බිඳීමෙහි දුෂ්කර වූයේද, බිඳුනද, වහා ගලපාගනු හැක්කේ ද වෙයි.

**ඉ**හත පදයයෙන් විස්තර කෙරෙන්නේ සත්පුරුෂයින්ගේ හා අසත්පුරුෂයින්ගේ සාමාන්‍ය ස්වභාවයයි. වර්තමාන සමාජයේ අපට බොහෝ දෙනෙකු ආශ්‍රය කිරීමට සිදුවේ. ආශ්‍රයට සුදුසු නුසුදුසු පුද්ගලයින් හඳුනාගත හැකි වන්නේ ටික කලක් ගත වීමෙනි. එය ප්‍රවේශමෙන් කළයුතු දෙයකි. අසත්පුරුෂ ආශ්‍රය තමන්ට අවැඩක්, අයහපතක්, අනර්ථයක් හා පීඩාවක් වෙනවා මිස කිසිදු අර්ථයක්, යහපතක්, සතුටක් ලබා නොදෙයි. අසත්පුරුෂයන්ගේ ස්වභාවය හැම විටම අනුන-ට අයහපතක්, අනතුරක්, අවැඩක් කිරීමට උත්සාහ දැරීමය. එ නිසා වරක් දුටු පමණින්, සිනාසුණ පමණින් කෙනෙකු පිළිබඳ පූර්ණ විශ්වාසය තැබීම නුවණට හුරු නැත. දුදනන්ගේ හෙවත් අසත්පුරුෂයින්ගේ ස්වභා වය ඉක්මනින් හිතවත් වී ඉක්මනින් අමනාප වීමයි. ඉන්පසු වෛර කිරීමට, පළි ගැනීමට යත්න දරයි. කිසි දිනෙක මිතුරු නොවෙයි. මිතුරු වුවද යටින් සතුරුකම් කරයි. ඉහත සඳහන් පද්‍යයේ මේ සඳහා කදිම උපමාවක් දක්වා ඇත. එනම්, දුර්ජනයා මැටි භාජනයක් වගේය යන්නයි. එය වහා බිඳෙන සුළුය. ඉදින් බිඳුණු පසු එය යළි එක්කිරීම ද අපහසු ය.

මෙහි අනෙක් පැත්ත සත්පුරුෂ හෙවත් සුදනන්ගේ ස්වභාවයයි. ඔහු හැමවිටම අන් අයගේ යහපත, අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරයි. යම් විටෙක අමනාප වුවත් ඔහු පළිගැනීමට නොපෙළෙඹෙයි. අමනාප වුවද එය දුරදිග ගෙන යන්නේ නැත. සියල්ල අමතක කොට යළි මිතුරු වෙයි. සත්පුරුෂයා උපමාකර ඇත්තේ රන් බඳුනකටය. රන් බඳුන අගනා එකකි. එමෙන්ම එය පහසුවෙන් බිඳිය හැක්කක් ද නොවේ. මෙහි විශේෂත්වය නම් බිඳුනොත් ප්‍රයෝජනයක් ගත හැකි පරිදි එය පහසුවෙන් එක් කළ හැකි වීමයි. මේ කරුණු අනුව සමාජ ආශ්‍රයෙන් සුදනා හා දුදනා පහසුවෙන් හඳුනාගත හැකිය. තරඟකාරිත්වයට මුල්තැන දෙන වත්මන් සමාජය මිනිස් ගුණදහම් නොතකා හැර ඇත. එය සමාජයේ යහ පැවැත්මට තර්ජනයකි. එනිසා ඔබ උතුම් මිනිස්කම්වල වටිනාකමත්, නොමිනිස්කම් වල ආදීනවත් වටහාගැනීම ඉතා වැදගත් ය.



***♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***පූජ්‍ය විල්ඔයේ විමලජෝති හිමි***
***ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය***
**ඔක්කම්පිටිය - මොනරාගල**
**Sri Lanka**

NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

Colombo Office
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632